ක්‍රිකට් පදනමේ ඩේවිඩ් කෘෂ්ස් මහතාත් විශාල කාර්ය භාරයක් ඉටු කළ බව මා විශේෂයෙන්ම සඳහන් කළ යුතුයි.

සංචාරයට අවශ්‍ය විය හියදම් පියවා ගැනීම සඳහා අනුග්‍රාහකයන් සොයා ගැනීමට අප දැරූ උත්සාහයේදී සහන මිලට ගුවන් ටිකට් පත් පමණක් නොව සංචාරයේ ගෙනයාමට අවශ්‍ය ක්‍රිකට් ආම්පන්න මෙවලම් පවා නොමිලේ ගෙන යාමට අප ජාතික ගුවන් සේවය ශ්‍රී ලන්කන් එයාලයින්ස් ඉදිරිපත් වීමත් ක්‍රීඩකයන්ගේ ඇඳුම් වලට අනග්‍රහය දැක්වීමත් සිදුකළා. ඒ වගේම අපට ක්‍රිකට් ඔසට්‍රේලියා හා ක්‍රිකට් වික්ටෝරියා මගින් ලැබුණ අනුග්‍රහය ඉතාමත් ප්‍රසංශනීයයි. ඔස්ට්‍රේලියානු කන්ඩායමේ නිල අනුග්‍රාහකයින් වන අඩිඩාස් සමාගම මාර්ගයෙන් ශ්‍රී ලංකාවේ දුෂ්කර ප්‍රදේශ වල නැගී එන ක්‍රීඩක දරුවන්ට බෙදා දීම සඳහා ඉතා වටිනා ක්‍රිකට් පන්දු පිති හා අනෙකුත් මෙවලම් තොගයක් ලබා දීම අපේ සංචාරය සාර්ථක කර ගැනීමට මහත් රුකුලක් වූ බව ස්තුති පූර්වකව සිහිපත් කරන්න ඕනෙ.

මෙම අනුග්‍රාහකයින් සම්බන්ධ කර ගැනීමට මහත් වෙහෙසක් දැරූ යොහාන් සහ කණ්ඩායමේ කළමනාකරු ලෙස කටයුතු කළ මිටර් මේසන් මහතා ගැන මම විශේෂයෙන් සිහිපත් කරන්න කැමතියි.

මෙම සංචාරයෙන් ක්‍රිකට් කණ්ඩායම හා අනෙකුත් නිලධාරීන් ලැබූ අත්දැකීම මොනවාද?

*චර්තන් නිසැන්ක*

කිසිදාක ලබන්නට බැරි තරම් සතුටක් මගේ හදවතට දුනුණ අවස්ථාවක් වශයෙන් මා සඳහන් කරන්න කැමතියි ක්‍රිකට් ක්‍රීඩා භාණ්ඩ දුෂ්කර පාසල් වල ක්‍රීඩකයන්ට ලබා දුන් අවස්ථාවේ එම දරුවන් ඉහ වහා ගිය සතුටින් මේ භාන්ඩ වැඳඳගත් අවස්ථාව. එය අප හැමගේම හෙත් වලටය කදුලු



ශ්‍රී ලංකාවේදී දින 12 ක් පුරා නොයෙකුත් ප්‍රදේශ වල සංවිදානය කර තිබූ තරග 6 ක තරග මාලාවෙන් තරග 4 ක් ජය ගැනීමට අපට හැකියාව ලැබුණා. ඊට අමතරව සංචාරක කණ්ඩායමට කුමාර් සංගක්කාර ලසිත් මාලිංග චාමර කපුගෙදර වැනි ශ්‍රී ලාංකික කණ්ඩායමේ ප්‍රබල ක්‍රීඩකයන් මුණ ගැසී පුහුණු කඳවුරක් පවත්වා ගුරු හරුකම් ලබා දීමටද

අපට හැකිවුණා. ඔවන් අදටත් ඉතා සතුටින් හා තෘප්තියෙන් එය සිහිපත් කරනවා. ඒ සඳහා මැදිහත් වී කටයුතු කළ නිලාන් හා දුලිප් සමරවීර සොයුරන් ඉතා කෘතඥ පූර්වකව සිහිපත් කරන්න කැමතියි. ඒව ගේම අපි වසරක් පාසා ධර්මරාජ විද්‍යාලය සමග කපුගෙදර කුසලානය පැවැත්වීමට ගිවිස ගත්තා. එය දිගින් දියටම පවත්වාගෙන යන්නට සියලුම පාර්ශව ඒකමතිකව තීරණයකට එළඹගත් බව ඉතාමත් සතුටින් කියන්න කැමතියි. දමුල්ල අසිගිරිය වැනි ජාත්‍යන්තර ක්‍රීඩා පිටි තණතිල වල මේ දරුවන්ට ක්‍රීඩා කරන්නට ලැබීමත් ඉතා වටිනා අත්දැකීමක්. අපත් සමග සංචාරය කළ ක්‍රීඩකයන්ගේ දෙමාපියන් හා අනෙකුත් නිලධාරීන්ගෙන් ශ්‍රී ලංකාවට ලැබෙන විදේශ විනිමයත් අප මව්බිමට ලැබෙන තවත් සේවාවක් වීම ශ්‍රී ලාංකිකයන් වශයෙන් අපට සතුටක්. අපේ රටේ ආගන්තුක සත්කාර ගැන හා සංස්කෘතිය ගැන ඔවුන් කතා කරන්නේ ඉතා සතුටකින්. මට මතක් වෙනවා එක් පියෙක් කියූ කතාවක්. -නුඹලාගේ රටේ මිනිස්සු මොන දේ ඇතත් නැතත් හිනාවෙන් උපන් හිනාවෙන් ජීවත් වන ජාතියක්. එය මිල කිරීමට හෝ මුදලට ලබා ගැනීමට නොහැකියි"

මේ සියලු දෙයටම වඩා මෙම සංචාරයේදී ජීවිතයේ ගෙනා දසුනක් වුනා. අප ඒ කටයුත්ත රංගිරි දඹුල්ල පාසලක පවත්වමින් තිබූ ක්‍රිකට් තරගයකින් පටන් ගෙන ශ්‍රී ලංකාව වටා තෝරාගත් දුෂ්කර පාසල් වලට ඔස්ට්‍රේලියානු ජාතික ක්‍රීඩකයන්ගේ ගේ හා දෙමාපියන්ගේ දෑත් වලින් ම එම දරුවන්ට පිරිනැමුවා. ඉතා විනිවිද පෙනෙන අයුරින් එම කටයුත්ත කරන්නට ලැබීම සතුටක් මෙන්ම අනුග්‍රාහකයන්ට සියලු තොරතුරු ලබා දුන් නිසා ඉදිරියටත් එම ව්‍යාපෘතිය කරගෙන යාමට හැකිවේ යයි මම විශ්වාස කරනවා.

එමෙන්ම ක්‍රිකට් ඔස්ට්‍රේලියා ප්‍රධාන විධායක නිලධාරි හමුවීමට ලැබුණ අවස්ථාව මම සිහිකරන්න කැමතියි. මීට මාස කිපයකට පෙර හමුවී එම අවස්ථාවේදී අප උස්මාන් කවාජි වැනි ක්‍රීඩකයන් ගැනත් ඔස්ට්‍රේලියාවේ විසිරුණ ආසියානු සම්භවයක් ඇති ක්‍රීඩකයන් ගැනත් කතා කළා. අද වෙනකොට එක් සිහිනයක් සැබෑ වී තිබෙනවා. එමෙන්ම ඉදිරියේදී පැවැත්වීමට බලාපොරොත්තු වන වයස 19ත් පහළ ලෝක

*සංගක්කාර සමග*

කුසලාන උළෙලක් සඳහා ජනවාරි 22 ට පෙර ආසියානු සම්භවයක් ඇති ක්‍රීඩකයන්ගේ නම් ඉදිරිපත් කරන ලෙස ඔවුන් අපට දන්වා එවා තිබෙනවා. ඒ අනුව ඉදිරියේදී දිනෙක ඔස්ට්‍රේලියානු කණ්ඩායම තුළ අපේ ක්‍රීඩකයන් දැක ගැනීමේ අවස්ථාව උදා වේවි යයි මම විශ්වාස කරනවා.

අවසන් වශයෙන් ඔබ ප්‍රවත්පතටත් ස්තූති කරනවා. ඉදිරියේදීත් මේ වැඩ කටයුතු වලට ඔබේ සහයෝගය ලැබේ යයි අපි බලාපොරොත්තු වෙනවා.

# BLOG කතන්දර

## බැංකුකාරයන්ගේ වැඩ

ඔන්න අපේ කතන්දර හාමිගේ ගාව තිබුණ පොඩි කාලෙ ඉඳල එකතු කරගත්තු සල්ලි වගයක්. රුපියල් පනස්දාහක් වගෙයි මට මතක. ඕක තිකං ගෙදර පුස් කකා තියාගන්න ඕනෑ නැති හින්ද, අපේ ඇනෙක්සිය ලගම තිබුණු සෙයිලං බැංකුවෙ ස්ථාවර තැන්පතුවක දාලයි තිබුණෙ.

ඔහොම ඉන්න අතරේ, මං තුමාට අල්ලපු රටේ දවස් හතර පහක අධ්‍යාපන කටයුත්තකට යන්න කාරණා කටයුතු යෙදුණ. ඒ වැඩෙන් පස්සෙ පොඩි ට්‍රිප් එකක් දාන්නත් එක්ක හිතාගෙන හාමිනේත් මේ ගමනට සෙට් වුණා.

ප්ලෑන් කලාට විතරක් මදි, ට්‍රිප් යන්න නං සල්ලිත් ඕනි නේ. ටිකට් එක ගන්න, හෝටලේට වැඩිපුර ගෙවන්න, සාරි ගන්න, එහකොට ඩියුටි පිදූදි එකෙන් බඩු ගන්න. ඉතිං මේ වෙලාවේ සිහියට ආවේ අර සෙයිලං බැංකුවේ දාල තියෙන පනස්දාහේ ෆික්ස්ඩ්පොසිට්වුවයි.

ඔන්න ඉතිං පහුවදාම හාමිනේ ගියා අල්ලපු වැටේ බැංකුවට තමන් ගේ සල්ලි පොජ්ජ විත්ඩ්‍රෝ කොරං එසඳ්සං කියල, එදා හවස කොළඹ ගිහින් ටිකට් එක ගන්නයි අපි ප්ලෑන් කලේ.

පැය භාගකට විතර පස්සෙ හාමිනේ ගෙට ගොඩ වැදුණ. මට දුන්න රුපියල් හතලිස් දාහක්.

ඇයි ඔයා ඉතුරු දහදාහෙන් ඩොලර්ස් ගත්තද? මං ඇහැව්ව.
කතා කරල බැලිත්නං වෙලා තියෙන්නේ මේකයි.

සෙයිලං බැංකුවේ ෆික්ස්ඩ්පොසිට්වුව ගන්න ගිය වෙලේ එතන හිටිය බැංකුකාරය ගෙ ටෝක් එකට රැවටිලා හාමිනේ ෆික්ස්ඩ්පොසිට්වුව එහෙමම තියෙද්දී ගෙදර ඇවිත් තියෙන්නේ ඌ ගෙන් ලෝන් එකක් අරං.

ෆික්ස්ඩ්පොසිට්වුවට පොලිය සියේට දහතුනයි. ලෝන් එක අරං තියෙන්නේ සියේට දාසයක පොලියට. ඒ මදිවට, දැන් මේ ලෝන් එක අරං තියෙන්නේ ෆික්ස්ඩ්පොසිට්වුව අපේට තියල නිසා, ලෝන් එකේ උපරිමය ෆික්ස්ඩ්පොසිට්වුවේ ගානෙං කොටසක් විතරයි.

සෙයිලං බැංකුකාරය කරල තියෙන්නේ හාමිනේ ගේ ම රුපියල් පනස්දාහෙන්, හතලිස්දාහක් හාමිනේ ට ම ණයක් විදියට දීල ඒ මදිවට ඒ ණයට සියේට තුනක පොලියක් අය කරන එක බව පහදල දෙන්න අන්තිමේදී මට පුළුවන් වුනා.

අල්ලපු රටේ රස්තියාදුව ගහල ඇවිල්ල පහුවදාම කලේ ෆික්ස්ඩ්පොසිට්වුව දියකරල ඒකං බැංකුවෙ ණය බේරපු එකයි. මේ වැඩෙන් රුපියල් පන්සීයකට විතර කෙලවුණා විතරක් නෙමේ, තව පැයක විතර කාලයකුත් නාස්තිවුණා.

කොහොමද බැංකුකාරයන් ගේ වැඩ? බැංකුකාරයෝ * ලෝක අමාරුකාරයෝ

## වෛද්‍ය පීටර්

කතන්දරකාරය කාලෙකට ඉස්සර මහනුවර පැත්තේ ලතිප්පොලකල ලැගල හිටියා. අපේ තිප්පොල තිබුනේ ගගක් අයිනේ එක පැත්තක. ගගේ අනිත් පැත්තේ තවත් තිප්පොලවල් කීපයක් ම තිබුණ. ඇත්තටම එකම එක පොකුරු තිප්පොලක් කියල කියන්න පුළුවන් මේ සේරම.

අපේ තිප්පොලට වැටිල තිබුණු අන්වර්ථ නාමය තමයි "කම්මල" කියන එක. මෙතන තිබුණු තවත් එක්තරා තිප්පොලකට අපි හැමෝම කිව්වෙ "මස් කඩේ" කියලයි.

ඔය කාලෙ අපි වගේ කොල්ලන් ට, බල්ලන් ට, නියා කාටවත් මොබයිල් ෆෝන් තිබුණෙ නෑ. අන්තර්ජාලය තිබුනේ ආතර් සී ක්ලාක් ට විතරයි. ඉතිං සේරම වැඩ වුනේ අනාදිමත් කාලෙක ඉඳල පැවත එන එන ක්ලැසිකල් ලයිම් ටෙස්ට්ඩ් ක්‍රමවලටයි.

මං හිතන්නේ අද නං කොල්ලෙකුට කෙල්ලෙක් ඇහැ ගැහුණොත් මුලින්ම කරන්නේ මොබයිල් ෆෝන් එකේ අංකය දෙන එක වෙන්න ඕනෑ. අපේ කාලේ කලේ පොඩි විසිටිං කාඩ් එකක් දීමයි. ඒකේ තියෙන්නේ තමයි, ලිපිනයයි.

එතැන ඉඳන් ඉතිං අවශ්‍ය නං ගණුදෙනු කරන්න පුළුවන් තැපැල් දෙපාර්තමේන්තුව හරහා. හැබැයි පුදුමේ කියන්නේ, මෙතනදි සමහර පොරවල් දෙන්නේම බොරු නම්.

මේ හා බැඳුණු කතන්දර කීපයක්ම තියෙනව මෙන්න අද ඒවායින් එකක්, දෙකක්, තුනක්.

ඔන්න දවසක් කාන්තා පක්ෂයේ කෙනෙක් ඔය ලමස් කඩේල තිප්පොල පැත්තේ කාවද හොයනවාලු. අපි අඳුණන පිරිසක් ඉඳල එතැනට ඇවිල්ලත් අහල තියෙනව දන්නවද මේ කියන කොල්ලව කියල.

මොකක්ද දන්නවද නම්? වෛද්‍ය පීටර්

පස්සෙ බැලිත්නම් කේස් එක මේකයි. අර මං මුලින් කිව්ව මස් කඩේ කොල්ලෙක් තමයි මේකට සම්බන්ධ.

අපි "මස් කඩේ" කිව්වට ඒ තිප්පොලේ ගියම නාමය තමයි වෛද්‍ය පීඨය. පොර මේ කාන්තාවට කියල තියෙනවා තමන් ඉන්නේ වෛද්‍ය පීඨයේ බව. ඒ මනුස්සයා හිතලා තියෙන්නේ මුගේ නම තමයි මේ ලවෛද්‍ය පීටර්ල කියන්නේ කියලයි. ඇයි අර වෛද්‍යසේකර, වෛද්‍යරත්න වගේ නං තියෙන අය හිටියනේ කලින් පරම්පරාවල.

00000000

ඒක නං කෙගෙකුට වුණු වැරදීමක් නේ. මේ කතන්දරේ නං ඇත්තටම කරපු එකක්.

අපේ පොරවල් කීපදෙනෙක් ගියා ටිකක් දුර පලාතක යාළුවෙකුගේ ගෙදර. ඒ සති අන්තයේ ඒ පලාතේ පන්සලේ පොසොත් පෙරහැරක්. ඉතිං මේ පෙරහැර බලන්න තෙරපී, තෙරපී ඉඳිද්දී, එක පොරකට ඔන්න පොඩි ලයින් එකක් වැඩ කළා. ඒ කෙලි පැටික්කි එක්ක කතා කරලා විසිටිං කාඩ් එකකුත් දීලයි පොර එදා ආපනු ආවේ.

මෙන්න ටික දවසකට පස්සේ එනවා ලියුමක් අපේ බෝඩ්මට. හැබැයි අපි දන්න කියන අඳුණන එකෙකුට නං නෙමේ. මේ ලියුම ඇඩ්ඩ්‍රස් කරලා තියෙන්නේ "මිහිඳු ප්‍රේමකුමාර" කියලයි.

පස්සෙ බැලිත්නං වෙලා තියෙන්නේ මේකයි. අපේ මෑන්ට හදිස්සියට ඒ කෙල්ලට දෙන්න බොරු නමක් හිතාගන්න බැරි වෙලා. ඒ පාර "මිහිඳු පෙරහැර" දැක්කහම එකපාරට ලම්හිඳු ප්‍රේමකුමාරල කියල හිතට ඇවිත්.

අපේ ඒ බොරු මිහිඳු මට දැන් මාස දෙක තුනකට කලිනුත් හම්බ වුනා

**කතන්දරකාරයා** http://kathandara.blogspot.com